රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 17/98

මගේ අංකය :-ආ/III/3/17-1
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

1998.05.06 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**දේපල ණය සඳහා ඇපකරුවන්**

**<u>ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයට සංශෝධන</u>**

ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 11:8 වගන්තියට සහ 1997.01.31 දිනැති රාජ්‍ය නිලධාරීන් සඳහා වූ අග්‍රහාර රක්ෂණ ක්‍රමයට අදාලව නිකුත් කරන ලද අංක 5/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි. උක්ත චක්‍රලේඛයේ 2(II) ඡේදයේ සඳහන් පරිදි තම මනාපය අනුව ණය සුරැකුම් රක්ෂණය සඳහා බැඳී ඇති නිලධාරීන්ට චක්‍රලේඛයේ 3 වන ඡේදයේ සඳහන් 3 වන ඇමුණුමේ දක්වා ඇති ප්‍රතිලාභ හිමිකම් ලැබෙන හෙයින් එම විධිවිධාන ඇතුළත් කරමින් පහත සඳහන් පරිදි 11:8:1 වශයෙන් උප වගන්තියක් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයට ඇතුළත් කරමින්, ආයතන සංග්‍රහයෝ XXIV පරිච්ජේයේ 11 වන වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

11:8:1 අග්‍රහාර රක්ෂණ ක්‍රමයේ ණය සුරැකුම් රක්ෂණය සඳහා දායක වී ඇති නිලධාරියකු සම්බන්ධයෙන් වන කල 11:8 හි සඳහන් පරිදි ඇපකරුවන් ඉදිරිපත් කිරීම වෙනුවට විකල්පයක් ලෙස රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 5/97 හි විධිවිධාන අනුව එකී රක්ෂණ සහතිකය ඇපයක් ලෙස ඉදිරිපත් කළ හැකිය.

02. මෙම විධිවිධාන 1997.01.31 දින සිට බලපැවැත්වෙනු ලැබේ.

අ.කලේ/(ඩික්සන් නිලවීර)
වැඩබලන ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය